කොවිඩ්-19 සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී කොවිඩ්-19 ආසාදිතයන් සහ ආශ්‍රිතයන් පිළිබඳව සමාජය තුළ ගර්හාත්මක හෝ කොන් කිරීමේ ආකල්පයක් ඇති නොවන ලෙසින් වාර්තාකරණය කිරීමත්, කොවිඩ්-19 රෝගීන්ගේ පුද්ගල ගරුත්වය ආරක්ෂා කිරීමත් ආචාර ධර්මානුකූල මාධ්‍යකරණයයි.

කෙසේ නමුත්, මේ වන විට කොවිඩ්-19 හා සබැඳි කොන් කිරීමේ ආකල්පයන් මාධ්‍ය තුළ දක්නට ලැබීම පහත බැස තිබීම සැබවින්ම සතුටට කරුණකි. නමුත් එය සම්පූර්ණයෙන්ම නැවතී ඇතැයි කිව නොහැක. ලංකාදීප පුවත් වාර්තාවක (08/05) සිරස්තලයේ දැක්වෙන "කොරෝනා පුතා" යන යෙදුම ඊට උදාහරණයකි. මෙහිදී අවධානයට ගත යුත්තේ, එම පුවතම වාර්තා කරනා මව්බිම (08/05) එහිදී "කොරෝනා රෝගියෙකු" යනුවෙන් අදාළ අයවලුන්ව හඳුන්වා ඇති බවයි.

එසේ නම්, මව්බිම එවැනි මධ්‍යස්ථ යෙදුමක් යොදාගන්නා විට, ලංකාදීප "කොරෝනා පුතා" වැනි යෙදුම් භාවිතා කරන්නේ මන්ද? එහිදී ලංකාදීප ආචාර ධාර්මික මාධ්‍යකරණයෙන් පිට පැන ඇතිවා නොවේද?

**#MediaEthicsSL #lka #sinhalanews #Lankadeepa #Mawbima**